# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 13 දරන
# කැලෑ (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1982 මාර්තු මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි.

# 1982 අංක 13 දරන කැලෑ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 25 වන දින.]

එල්. ඩී.—ඕ. 4/81

කැලෑ ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1982 අංක 13 දරන කැලෑ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 56 දරන පනතින් අවසාන වරට සංශෝධනය කරනු ලැබූ කැලෑ ආඥාපනතේ 7 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 451 වන අධිකාරයේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "අවුරුදු පහක් දක්වා දීර්ඝ විය හැකි කාලයක බන්ධනාගාරගත කිරීමකට ද," යන වචන වෙනුවට "අවුරුදු දෙකකට නොඅඩු හා අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට ද," යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් වරදක් කිරීමට අනුබල දෙන හෝ එවැනි වරදක් කිරීමට සලස්වන යම් තැනැත්තකු ද වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබීමෙන් පසු—

(අ) ඒ උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ) හෝ (ඊ) ඡේද යටතේ වරදක් කිරීමට අනුබල දෙන හෝ සලස්වන අවස්ථාවක අවුරුදු එකකට නොඅඩු හා අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට ; සහ

(ආ) ඒ උපවගන්තියේ වෙනත් යම් ඡේදයක් යටතේ වරදක් කිරීමට අනුබල දෙන හෝ එවැනි වරදක් කිරීමට සලස්වන අවස්ථාවක ඒ වරද සඳහා ඒ උපවගන්තියෙහි නියම කර ඇති දඬුවමට

යටත් විය යුතු ය." ; සහ

(ඇ) ඒ වගන්තියේ අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3) වන සංරක්ෂකවරයාගේ ලිඛිත අනුමතය ඇතිව හැර, මේ වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් කිසිම නඩු පැවරීමක් කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. 1979 අංක 56 දරන පනතින් අවසාන වරට සංශෝධනය කරන ලැබූ ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට හා ඒ වෙනුවට පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

"(2) මේ පරිච්ඡේදයෙහි සඳහන් යම් වරදක් කිරීමට අනුබල දෙන හෝ එවැනි වරදක් කිරීමට සලස්වන යම් තැනැත්තකු ද වරදකට වරදකරු වන අතර, වරදකරු කරනු ලැබීමෙන් පසු—

(අ) 21 වන වගන්තියේ අතුරු වගන්තියේ සඳහන් කරන ලද වරදක් සම්බන්ධයෙන් හැර ඒ වගන්තියේ සඳහන් වරදක් සම්බන්ධයෙන් වන විට රුපියල් එක්දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොඅඩු හා අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට ද ;

(ආ) 21 වන වගන්තියේ අතුරු වගන්තියේ සඳහන් කරන ලද වරදක් සම්බන්ධයෙන් වන විට මාස හයකට නොඅඩු හා අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට ද,

යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. 1979 අංක 56 දරන පනතින් අවසාන වරට සංශෝධනය කරනු ලැබූ ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(අ) "රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයක බන්ධනාගාරගත කිරීම කට" යන වචන වෙනුවට "රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොඅඩු හා එක් අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට" යන වචන ආදේශ කිරීමෙන් ; හා

(ආ) ඒ වගන්තියේ අතුරු වගන්තියේ "අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීම කට" යන වචන වෙනුවට "හය මාසයකට නොඅඩු හා අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. 1979 අංක 56 දරන පනතින් අවසාන වරට සංශෝධනය කරනු ලැබූ ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) "රුපියල් එක්දහසකට නොවැඩි දඩයකින් හෝ මාස හයක් දක්වා දීර්ඝ විය හැකි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට" යන වචන වෙනුවට "රුපියල් දෙසියයකට නොඅඩු හා රුපියල් එක් දහසකට නොවැඩි දඩයකින් හෝ මාස තුනකට

නොඅඩු හා මාස හයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම" යන වචන ආදේශ කිරීමෙන්, හා

(ආ) ඒ වගන්තියේ දෙවන අතුරු වගන්තියේ " රුපියල් දෙදහසකට නොවැඩි දඩයකින් හෝ එක් අවුරුද්දක් දක්වා දීර්ඝ විය හැකි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට" යන වචන වෙනුවට " රුපියල් දෙසියයකට නොඅඩු හා රුපියල් දෙදහසකට නොවැඩි දඩයකින් හෝ මාස තුනකට නොඅඩු හා එක් අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට" යන වචන ආදේශ කිරීමෙන්, හා

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) "අවුරුදු පහ දක්වා දීර්ඝ විය හැකි කාලයක බන්ධනාගාරගත කිරීමකට" යන වචන වෙනුවට "මාස තුනකට නොඅඩු හා අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට" යන වචන ආදේශ කිරීමෙන්, හා

(ආ) ඒ උපවගන්තියේ අතුරු වගන්තියේ "රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හය දක්වා දීර්ඝ විය හැකි කාලයක බන්ධනාගාරගත කිරීමකට" යන වචන වෙනුවට "රුපියල් දෙසියයකට නොඅඩු හා රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ මාස තුනකට නොඅඩු හා මාස හයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට" යන වචන ආදේශ කිරීමෙන්.

6. 1979 අංක 56 දරන පනතින් අවසාන වරට සංශෝධනය කරනු ලැබූ ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකටම" යන වචන වෙනුවට "රුපියල් පන්සියයකට නොඅඩු හා රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනකට නොඅඩු හා මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

7. 1979 අංක 56 දරන පනතින් අවසාන වරට සංශෝධනය කරනු ලැබූ ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

'දැව, කැලෑවක උපදින ද්‍රව්‍ය ආදිය රාජ සන්තක කිරීම.

40. (1) යම් තැනැත්තකු කැලෑ වරදකට වරදකරු කරනු ලැබීමෙන් පසු—

(අ) ඒ වරද සිදු කරන ලද්දේ රජයේ දේපළ නොවන යම් දැව හෝ කැලෑවක උපදින යම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් ද ඒ සියලු දැව හෝ කැලෑවක උපදින ද්‍රව්‍ය ; හා

(ආ) ඒ වරද සිදු කිරීමේ දී පාවිච්චි කරන ලද සියලු උපකරණ, බෝට්ටු, කරත්ත, ගවයන් හා මෝටර් වාහන (ඒ උපකරණ, බෝට්ටු, කරත්ත, ගවයන් හා මෝටර් වාහන ඒ තැනැත්තාට අයිති වුවද අයිති නොවුවද),

ඒ වරදකරු කරනු ලැබීමේ හේතුවෙන් රාජසන්තක කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රාජ සන්තක කරනු ලැබූ යම් දේපළක්—

(අ) අදාළ වරදකරු කරනු ලැබීමට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් නොකරන ලද්දේ නම්, ඒ වරදකරු කරනු ලැබීමට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා නියමිත කාලය ඉකුත් වූ දින සිට රජය වෙත පූර්ණ වශයෙන් සතු කරනු ලැබිය යුතු ය ;

(ආ) අදාළ වරදකරු කරනු ලැබීමට විරුද්ධව අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරන ලද්දේ නම්, ඒ වරද කරු කිරීම අභියාචනයෙන් ස්ථිර කරන ලද දිනයේ සිට රජය වෙත පූර්ණ වශයෙන් සතු කරනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියේ "අදාළ වරදකරු කරනු ලැබීම" යන්නෙන්, යම් වරදකරු කරනු ලැබීමක ප්‍රතිඵල වශයෙන් (1) වන උපවගන්තිය යටතේ යම් දේපළක් රාජසන්තක කරනු ලැබේ ද, ඒ වරදකරු කරනු ලැබීම අදහස් වේ.'.

**8.** 1979 අංක 56 දරන පනතින් අවසාන වරට සංශෝධනය කරනු ලැබූ ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියෙහි "රජයේ දේපළ නම් හෝ රාජසන්තක කර තිබේ නම්" යන වචන වෙනුවට "රජයේ දේපළ නම් හෝ 40 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ රජය සතු කර තිබේ නම්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 43 වන වගන්තියෙහි "40 වන හෝ 41 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් ආඥාවක්" යන වචන හා ඉලක්කම් වෙනුවට "41 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් ආඥාවක්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 44 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය ඉවත් කිරීම.

**11.** 1979 අංක 56 දරන පනතින් සංශෝධනය කරනු ලැබූ ප්‍රධාන ප්‍රඥප්තියෙහි 58 වන වගන්තියෙහි (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් හා ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) (1) වන උපවගන්තියේ විධිවිධාන නොතකා අමාත්‍යවරයා විසින්—

(අ) 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය දැව සංස්ථාවේ යම් සේවානියුක්තයකුට මේ ආඥාපනතේ 24 වන, 27 වන, 37 වන හෝ 48 වන වගන්තිවල කාර්ය සඳහා කැලෑ නිලධරයකුගේ කර්තව්‍ය ඉටු කිරීමට ; හෝ

(ආ) 1958 අංක 4 දරන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ හෝ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ හෝ කෘෂිකර්ම සංවර්ධන අධිකාරියේ යම් සේවානියුක්තයකුට මේ ආඥාපනතේ 27 වන, 37 වන හෝ 48 වන වගන්තිවල කාර්ය සඳහා කැලෑ නිලධරයකුගේ කර්තව්‍ය ඉටු කිරීමට

බලය පවරනු ලැබිය හැකි අතර, එවැනි යම් නිලධරයකු මේ කර්තව්‍ය ඉටු කිරීමේ නිරත වී සිටිය දී කැලෑ නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය